# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1825/11 – 2013 අගෝස්තු 27 වැනි අඟහරුවාදා – 2013.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**
19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය
(නාමමාත්‍රිකව)

විශේෂ අංකය : කො/2472.

කොළඹ 07, සර් මාකස් ප්‍රනාන්දු පාර, අංක 36 හි පදිංචිව සිට නැසීගිය සර් මාකස් ප්‍රනාන්දු මහතාගේ බූදලයේ භාරකරුවන් විසින් එම බූදලයට අයත් ඉඩම් සම්බන්ධයෙන් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින් පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව එම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම්වලින් ඔහුට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට තබා ගැනීමට ඉඩ දෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි උපලේඛනයෙහි දැක්වේ.

අධි නීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2013 අගෝස්තු මස 15 වැනි දින.
අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

උපලේඛනය

01. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාගම් පත්තුවේ මරක්කලමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් සිතියම් අංක 2145 හි දැක්වෙන කොවුල්වැව වත්ත නමැති ඉඩමෙහි කැබලි අංක 15 දරන බිම් කොටසෙහි අක්කර 48 රූඩ් 0 පර්චස් 38 ක ප්‍රමාණය ඇති බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු හා ගොඩනැගිලිද.

02. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාගම් පත්තුවේ මරක්කලමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් සිතියම් අංක 2145 හි දැක්වෙන කොවුල්වැව වත්ත නමැති ඉඩමෙහි කැබලි අංක 16 දරන බිම් කොටසින් නොබෙදූ අක්කර 01 රූඩ් 3 පර්චස් 32 ක ප්‍රමාණය ඇති බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලිද, වේ.

09 - 214

1A – G 18173 – 160 (2013/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*